**වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශීය සභාව**
**යාපනය දිස්ත්‍රික්කය**

-----------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 29 දින හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 අගෝස්තු 31 දින සභාපතිවරයා වෙත ඉදිරිපත් කරන ලදී.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව සතු නොවන සාතකාගාර 03ක් ඉඩම් හා ගොඩනැගිලි ගිණුමෙහි ඇතුළත් කිරීම නිසා වත්කම්වල වටිනාකම රු.1,423,096කින් ගිණුම්වල වැඩියෙන් දක්වා තිබුණි. | මූලධන වියදම් නිසා වත්කම් යටතට ගිණුම්ගත කරන ලදී. ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ. | සභාව සතු වත්කම් පමණක් ඇතුළත් කළ යුතු වේ. |

### 1.4 අනුකූල නොවීම

#### 1.4.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| 126 (III) (ඊ) වගන්තිය | රු.130,100ක් වටිනා නීතිවිරෝධී දැන්වීම් 65 ක් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග සභාව විසින් ගෙන නොතිබුණි. | ප්‍රචාරක දැන්වීම් පුවරු නාම 08ක් වෙනුවෙන් ගාස්තු අයකර ගෙන ඇත. | ප්‍රාදේශීය සභා පනතේ විධිවිධානවලට අනුව නීතිවිරෝධී දැන්වීම් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 1988 වර්ෂයේ ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති | | | |
| | X පරිච්ඡේදයේ 193 වගන්තිය | සමාලෝචිත වර්ෂයේ එක් එක් ආදායම් හා වියදම් වැඩිවීම හා අඩුවීම වෙන වෙනම පරිශීලනය කර නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීතින්වලට අනුකූලව ආදායම් හා වියදම් වැඩිවීම හා අඩුවීම සඳහා හේතු වෙන වෙනම පරිශීලනය කර කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | මුදල් රෙගුලාසි 371 | සභාව විසින් ලබාදී තිබු රු. 314,878ක් වටිනා අත්තිකාරම් නිරවුල් කර නොතිබුණි. | අත්තිකාරම් නිරවුල් කිරිමට ක්‍රියාමාර්ග ගෙන ඇත. | නිරවුල් නොකළ අත්තිකාරම් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසිවලට අනුකූලව නියමිත ක්‍රියාමාර්ග ගත යුතු වේ. |
| | මුදල් රෙගුලාසි 571 | කොන්ත්‍රාත්කරුට ආපසු ගෙවිය යුතු රු.1,653,205 ක් වටිනා රඳවා ගැනීමේ මුදල් සහ ලංසු තැන්පතු 40 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | ආපසු ගෙවීමට කටයුතු කරමින් සිටී. | ආපසු ගෙවිය යුතු වටිනාකම් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු සභාව විසින් ගත යුතු වේ. |
| (ඈ) | අනෙකුත් චක්‍රලේඛ | | | |
| | 2018.07.19 දිනැති අංක 2018/e පළාත්පාලන -01 දරන පළාත්පාලන චක්‍රලේඛය | ප්‍රජාවට අන්තර්ජාලය මාර්ගයෙන් සේවාවන් ලබාගැනීමේ පහසුකම් සලසා දි නොතිබුණි. | අන්තර්ජාල පහසුකම් ලබාගැනීමට කටයුතු කර ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රජාවට අන්තර්ජාල සේවාවන් සලසා දිමට ක්‍රියාමාර්ග ගත යුතුවේ. |
| | 1981.12.09 දිනැති අංක 161 දරන චක්‍රලේඛය | නිලධාරීන් 53දෙනෙකුට රු.244,400ක නිල ඇඳුම් ලබාදී තිබු නමුත් අදාල නිලධාරීන් නිලඇඳුමින් සැරසී නොසිටියහ. | නිලධාරීන්, සේවකයන්, කාර්යාල රාජකාරි වේලාවේ නිලඇඳුමින් සැරසී සිටීම අනිවාර්යයෙන් සිදුකළ යුතු බවට උපදෙස් ලබාදී ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව නිලඇඳුම් දීමනාව ලබාදුන් නිලධාරීන් නිලඇඳුමින් සැරසී සිටීමට නියමිත ක්‍රියාමාර්ග සභාව විසින් ගත යුතුවේ. |

### 1.4.2 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වගන්තිය ප්‍රකාරව අදාල ඇතැම් ඉඩම් විකුණුම් මත 1% ක විකුණුම් බදු සභාව විසින් අයකර නොතිබුණි. | වෙන්දේසියේ විකිණීම් සිදුනොවීය. | ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව, විකුණුම් මත, විකුණුම් බදු අයකිරීමට සභාව විසින් කටයුතු කළ යුතු වේ. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 28,601,710ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 91,347,285 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 | | | | 2018 | |
|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 4,614,096 | 4,902,928 | 10,451,561 | 674,390 | 4,789,809 | 7,818,398 |
| කුලී | 19,191,490 | 20,668,546 | 322,575 | 19,958,110 | 16,211,489 | 322,575 |
| බලපත්‍ර ගාස්තු | 3,577,600 | 6,541,541 | 9,000 | 4,494,100 | 4,873,396 | 48,317 |
| වෙනත් ආදායම් | 136,101,867 | 73,007,647 | 148,915,043 | 115,379,590 | 136,701,293 | 213,421,162 |
| | 163,485,053 | 105,120,662 | 159,698,179 | 140,506,190 | 162,575,987 | 221,610,452 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2018 වර්ෂයේ රැස්කළ ආදායම රු. 162,575,986 ක් වුවත්, 2019 වර්ෂයේ රැස්කළ ආදායම රු. 105,120,662 කින් අඩු වීමෙන් 2018 වර්ෂය සමඟ සැසඳීමේදී 2019 වර්ෂයේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය අඩු වී තිබුණි. එසේම, බිල් කළ ආදායම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මින් ඉදිරියේදී ක්‍රියාමාර්ග ගනු ලැබේ. | සභාවේ ආදායම් වැඩිකිරීමට සුදුසු පියවර සභාව විසින් ගත යුතු වේ. |
| (ආ) ආදායම් බිල් කර රැස්කිරීමට පසුගිය වර්ෂ 05 ක් පුරා සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | ආදායම් බිල් කර රැස්කිරීමට සුදුසු කටයුතු කළ යුතු වේ. |

### 2.2.3 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ සභාවේ හිඟ වරිපනම් හා බදු රු.10,451,561 ක් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරමින් පවති. | හිඟ වරිපනම් බදු නියමිත කාලයේ අයකර ගැනීමට සභාව විසින් කටයුතු කළ යුතු වේ. |

### 2.2.4 කුලී

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) හිඟ කඩ කුලී රු.14,000ක් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | හිඟ කඩ කුලී අයකිරීමට කටයුතු කරමින් පවතී. | හිඟ කඩ කුලී බදු නියමිත කාලයේ අයකර ගැනීමට සභාව විසින් කටයුතු කළ යුතු වේ. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ හිඟ මස්කඩ බදුකුලී සහ දඩමුදල් රු.356,891ක් පසුගිය වර්ෂ 05කට අධික කාලයක සිට අයකිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | මස්කඩ හිඟ බදු කුලී මුදල් ලබාගැනීමට අදාල පුද්ගලයා සම්බන්ධ කර ගත නොහැකිවී ඇත. | හිඟ කුලී සහ හිඟ දඩ මුදල් නියමිත කාලයේ අයකර ගැනීමට සභාව විසින් කටයුතු කළ යුතු වේ. |

2.2.5 උසාවි දඩ මුදල් හා මුද්දර ගාස්තු

(අ) උසාවි දඩ මුදල්

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2019 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ මුදල් රු.5,710,290 ක් ලැබිය යුතුව තිබුණි. | ප්‍රධාන ලේකම්වරයාට ඉල්ලීම් ලිපිය යවා ඇත. | හිඟ උසාවි දඩ මුදල් නියමිත කාලයේ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

(ආ) මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ සියළුම බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු රු.137,336,990 ක් ලැබිය යුතුව තිබුණි. | අවසන් ගිණුම්වලින් ලැබිය යුතු ශේෂ ගලපනු ලැබේ. | හිඟ මුද්දර ගාස්තු නියමිත කාලයේ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව, මහජන සෞඛ්‍යය, පොදු උපයෝගීතා සේවාවන් සහ පොදු මංමාවත්, මහජන සුබ විහරණය, පහසුකම් හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව මූලික කරුණු 30ක් සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා ස්ථාපිත කළ යුතු වුවත් 2017 දෙසැම්බර් 31 දින වන විටත් මූලික කරුණු 26ක් සඳහා පමණක් අතුරු ව්‍යවස්ථා සකස් කර තිබුණි. | ඉතිරි අතුරු ව්‍යවස්ථා සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. | පනත ප්‍රකාරව අතුරු ව්‍යවස්ථා ස්ථාපිත කිරීමට සුදුසු ක්‍රියාමාර්ග සභාව විසින් ගත යුතු වේ. |

**(ආ) ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ක්‍රියාත්මක කළ යුතුව තිබූ ක්‍රියාකාරකම් 26 ක් සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් සකස් කළ යුතු වේ. |

**(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | විවෘත වාහනවලින් කසළ එකතු කරන බැවින් මාර්ගවල ගමන් කරන ජනතාවට සෞඛ්‍ය ආශ්‍රිත ගැටළු පවතින අතර මාර්ගය පුරා කසළ වැටී තිබුණි. | ගාස්තු අයකිරීමට කටයුතු කර ඇත. | ඝන අපද්‍රව්‍ය කළමනාකරණයට අනුව අපද්‍රව්‍ය ඉවත් කිරීමට ඵලදායි ක්‍රියාමාර්ග සභාව විසින් ගතයුතු වේ. |
| (ii) | සෞඛ්‍ය කම්කරුවන්ට වෛද්‍ය පරීක්ෂණයන් සිදු කර නොතිබුණි. | ඝන අපද්‍රව්‍ය කාර්යයන්වල නිරතව සිටින සියළුම කම්කරුවන්ට මෙම වර්ෂයට අදාල එන්නත් ලබාදී ඇත. | සෞඛ්‍ය කම්කරුවන්ට නියමිත වෛද්‍ය පරීක්ෂණයන් අදාල කාලයේ සභාව විසින් සිදු කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (iii) | ඝන අපද්‍රව්‍ය වෙන් කිරීමකින් තොරව එකට රැස් කර තිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | ඝන අපද්‍රව්‍ය කළමනාකරණයට අනුව සුදුසු ක්‍රියාමාර්ග සභාව විසින් ගතයුතු වේ. |

**(ඈ) පාරිසරික ගැටළු**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා තෝරාගෙන තිබූ ප්‍රදේශයේ මැසි තෙල් ඉසීම සහ දුර්ගන්ධය වැලැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඝන අපද්‍රව්‍ය බැහැර කරන ස්ථානයේ බෙහෙත් ඉසීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. | ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේදී පරිසරය ආරක්ෂා කිරීමට සුදුසු ක්‍රියාමාර්ග සභාව විසින් ගත යුතුවේ. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | උප කාර්යාලයේ වරිපනම් බදු ලේඛනය 1995 වර්ෂයේදී විනාශයට පත්වී තිබුණු නමුත් අයකිරීම සඳහා ක්‍රියාමාර්ග කිසිවක් මේ දක්වා ගෙන නොතිබුණි. | ලේඛනය සකස් කිරීමට පියවර ගනිමින් සිටී. | දේපල නැවත තක්සේරු කිරීමට සුදුසු පියවර සභාව විසින් ගත යුතුය. |
| (ආ) | පසුගිය වර්ෂ 04ක් පුරා රු.13,197,084ක් වැය කර ඉදිකළ නීර්වේලි වෙන්කිරිමේ මධ්‍යස්ථානය සඳහා 2019 වර්ෂයේදි තවත් රු.1,546,524ක් වැයකර තිබු නමුත් මෙම සාතකාගාරය ඵලදායි අයුරින් ක්‍රියාත්මක කර නොතිබුණි. | අපද්‍රව්‍ය බැහැර කිරිමේදි ආදායම් ලැබිය යුතුවේ. | වෙන්කිරිමේ මධ්‍යස්ථානය ඵලදායි අයුරින් ක්‍රියාත්මක කිරීමට සුදුසු පියවර සභාව විසින් ගත යුතුය. |
| (ඇ) | 2019 වර්ෂයේදී ගොඩනැගිලි අනුකූලතා අයැදුම් පත් 67ක් සඳහා සභාව විසින් අදාල අනුමැතීන් ලබාදී නොතිබුණි. | ඉදිරියේදි අයදුම්කරුවන් විසින් අඩුපාඩු නිවැරදි කරනු ලබන අවස්ථාවේදි අනුමැතිය ලබාදෙනු ලැබේ. | ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව නියමිත කාලය තුළ ගොඩනැගිලි අනුකූලතා අයැදුම් පත් සඳහා අනුමැතිය ලබාදීමට පියවර සභාව විසින් ගත යුතුය. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් නියමිත පරිදි මානව සම්පත් ලබාගෙන යොදවා නොතිබු බැවින්, එවැනි මානව සම්පත් 36 ක් විසින් ඉටු කළයුතු සේවාවන් ප්‍රමාදවී තිබුණු බව විගණනයේදි නිරීක්ෂණය විය. | ඉහත සඳහන් තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කර ඇත. | තනතුරු පුරප්පාඩු නියමිත කාලයේ පිරවීමට සුදුසු කටයුතු සභාව විසින් ගත යුතු වේ. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2016 වර්ෂයේදී බදු පදනම මත ලබා දුන් මස් කඩය සඳහා රු.300,000ක් බදුකරුගෙන් වර්ෂ 03 ක කාලයක සිට අය කර ගෙන නොමැති අතර මේ සම්බන්ධයෙන් නඩුවක් විභාග වෙමින් පවතින අතර මෙම කරුණ පිළිබඳ අවශ්‍ය හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශනවල සිදුකර නොතිබුණි. | ඊළඟ මූල්‍ය වර්ෂයේ හෙළිදරව් කිරීමට පියවර ගෙන ඇත. | අපේක්ෂිත බැරකම් සම්බන්ධයෙන් අසම්භාව්‍ය බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අනවසර මායිම් බැම්ම ඉදිකිරීම සම්බන්ධයෙන් නඩුවක් විභාග වෙමින් පැවතුණද මේ සම්බන්ධයෙන් සිදුකළ යුතු හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශනවල සිදුකර නොතිබුණි. | ඊළඟ මූල්‍ය වර්ෂයේ හෙළිදරව් කිරීමට පියවර ගෙන ඇත. | අපේක්ෂිත බැරකම් සම්බන්ධයෙන් අසම්භාව්‍ය බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුවේ. |
| (ඇ) | උලවික්කුලම් පිල්ලෙයාර් කෝවිල් මාර්ගය සම්බන්ධයෙන් සභාවට එරෙහිව නඩුවක් විභාග වෙමින් පැවැති නමුත් මේ සම්බන්ධයෙන් සිදුකළ යුතු හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශනවල සිදුකර නොතිබුණි. | ඊළඟ මූල්‍ය වර්ෂයේ හෙළිදරව් කිරීමට පියවර ගෙන ඇත. | අපේක්ෂිත බැරකම් සම්බන්ධයෙන් අසම්භාව්‍ය බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුවේ. |

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 පවරා නොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාහන 05 ක අයිතිය සභාව වෙත අයිතිය මාරු කිරීමට කටයුතු කර නොතිබුණි. | මේ දක්වා වාහන 05 ලියාපදිංචි නොකර පැවැතුණි. | වාහනවල අයිතිය සභාවට පැවරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

**4 ප්‍රසම්පාදනය**

**4.1 ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 මාර්ගෝපදේශයේ සඳහන් පරිදි සේවාවන් සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොතිබුණි. | අනුමත ආකෘතියට අනුව ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

**5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**5.1 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ ඇස්තමේන්තුගත වියදම් හා තථ්‍ය වියදම් අතර ප්‍රමාණාත්මක විචලනයන් පැවැතීම නිසා අයවැය ඇස්තමේන්තුව ඵලදායී නොවූ පාලන කාරකයක් බව දක්නට ලැබුණි. | මුද්දර ගාස්තු හා උසාවි දඩ මුදල් ඊළඟ මූල්‍ය වර්ෂයට එකතු කළ යුතුව තිබූ නිසා ලැබූ ආදායම්වලින් වියදම් පාලනය කළ බැවින් අයවැය හා තථ්‍ය වියදම් අතර විචලනයන් වැඩිවී තිබුණි. | අයවැය නිවැරදි ආකාරයෙන් සැලසුම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. |